# THE WHITE HACKLE

# වයිට් හැකල් විශේෂ කලාපය

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව இலங்கை காலாட் படை சஞ்சிகை JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

SPECIAL EDITION

විශේෂ කලාපය

## වර්ණ ප්‍රදානය, ප්‍රතිප්‍රදානය හා රණවිරු ස්මාරකය විවෘත කිරීමේ උත්සවය

## Colours Awarding,Re Awarding & Monument Opening Ceremony



SPECIAL EDITION
Published by
Regiment Centre Sri Lanka Light Infantry

**THE PRESIDENT'S AND REGIMENTAL COLOURS**
of the
Sri Lanka Light Infantry Regiment, 1st Battalion &
2nd Volunteer Battalion The Sri Lanka Light Infantry
Presented by
**His Excellency Mithripala Sirisena**
President of the Democratic Socialist Republic of Sri Lanka
On 26th October 2015



| | | |
|---|---|---|
| 1 | ජනාධිපති වර්ණ ප්‍රධාන උත්සවය වෙනුවෙන් ප්‍රණාමය පුද කිරිම. | 3 |
| 2 | ශ්‍රී ලංකා පාබල හමුදා ආරම්භය | 04 - 06 |
| 3 | ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව | 07 - 09 |
| 4 | රෙජිමේන්තු මංගල හස්තියා - කණ්ඩුල | 10 |
| 5 | ශ්‍රී ලංකා පාබල හමුදාව තුළින් බිහි වූ විශිෂ්ට නායකයින් | 11 - 16 |
| 6 | 1 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඉතිහාසය | 17 - 20 |
| 7 | විශේෂාංග ලිපිය | 21 |
| 8 | 1 ශ්‍රීලපාහ වෙත ලබා දෙන ලද පැරණි වර්ණ දජ | 22 |
| 9 | 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ පිළිබඳ ඉතිහාසය | 23 - 26 |
| 10 | 2 වන (සෙව්) බළඇණි ඉතිහාසය | 27 |
| 11 | 2(සෙව්) ශ්‍රීලපාහ වෙත ලබා දෙන ලද පැරණි වර්ණ දජ | 28 |
| 12 | 2 වන (සෙව්) ශ්‍රීලපාහ වර්ණ පිළිබඳ ඉතිහාසය | 29 - 31 |
| 13 | නව වර්ණ ප්‍රදානය, ප්‍රතිප්‍රදානය පිළිබඳ විස්තර | 32 |
| 14 | ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙත ලබාදෙන ලද වර්ණ ධජ | 33 |
| 15 | 1 ශ්‍රීලපාහ වෙත පුණර්ප්‍රදානය කරන ලද වර්ණ ධජ | 34 |
| 16 | 2(සෙව්)ශ්‍රීලපාහ වෙත පුණර්ප්‍රදානය කරන ලද වර්ණ ධජ | 35 |
| 17 | ආරක්ෂක ලේකම් තුමන් ප්‍රධාන ශ්‍රීලපාහ නිලධාරී නිවස්නයේ පැවති රාත්‍රී භෝජන සංග්‍රහයේ විශේෂ අවස්ථා | 36 - 37 |
| 18 | වර්ණ පෙළපාළියේ කාර්ය මණ්ඩලය | 38 - 40 |
| 19 | ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ ප්‍රදාන ඉතිහාසය වර්ණවත් කළ ලුතිතන් (උපා) කේ එන් සිල්වා | 41 |
| 20 | වර්ණ ධජ පෙළපාළිය සඳහා සහභාගී වූ නිලධාරීන්/සෙසුනිලයින් | 42 - 54 |
| 21 | සදා නොමියෙන පාබල විරුවෝ | 55 - 56 |
| 22 | ශ්‍රීලපාහ රෙජිමේන්තු රණවිරු ස්මාරකය විවෘත කිරීමේ උත්සව | 57 - 59 |
| 23 | පාබල හමුදා රෙජිමේන්තු ගීතය | 60 |




***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***

# WHITE HACKLE SPECIAL EDITION
# වයිට් හැකල් විශේෂ කලාපය


**Colonel of The Regiment**

Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc

**Centre Commandant**

Brig MM Kithsiri RSP

**Deputy Centre Commandant RHQ SLLI**

Col GMN Perera RWP RSP

**Adjutant RHQ SLLI**

Maj KY Priyadarshana RSP psc SLLI

**The White Hackle Editors**

Chief Consultant

Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc

Editor in Chief

Brig MM Kithsiri RSP

Assistant Editors

Lt Col Thabraw RWP RSP psc SLLI

( CO - 1st Battalion SLLI )

Maj KY Priyadarshana RSP psc SLLI

( Adjutant RHQ SLLI )

Maj AD Gunarathne RSP SLLI

(Officer In Charge )

Maj TMAN Thennakoon RWP SLLI

(Press Officer In Charge)

**Honourary Consultants**

GenRMDRathnayake(Retd)WWV RWP RSPVSV USP ndu psc

LtGenHVAtukorale(Retd)VSVpscFBIM

Brig AER Abeyesinghe (Retd) KSV

**Computer Type Setting & Designed**

L / C Suranga RBP - White Hackle RHQ - 25 SLLI



**WHITE HACKLE PUBLICATION**

Publisher -Regiment Centre Sri Lanka Light Infantry

Telephone- 0112855204 / 0112855357 - 59

Ext-57656

Fax- 0112855204

E-mail-editor.whitehackle@gmail.com, editor.whitehackle@yahoo.com

Website- www.army/lightinfantry.lk


## - කතුවැකිය -

හිරු නොබසින අධිරාජ්‍යයේ මහා රාජිණියගේ පැසසුමට මෙරට රාජ්‍ය නායකයින්ගේ ගරු බුහුමනටද ලක්වෙමින් රාජිණි වර්ණ මෙන්ම ජනාධිපති වර්ණද ලබාගත් ශ්‍රී ලංකා ධරණීතලයේ බිහිවූ ඉපැරණි ප්‍රථම රෙජිමේන්තුව වූ ශ්‍රී ලංකා පාබල හමුදාව එදා මෙදා තුර "සේවය කරමි" යන්න පෙරදැරිව සුවිශේෂී කඩඉම් ගනනාවක් පසුකර ඇත 2015 ක් වූ වප් මස 26 වන දිනද ශ්‍රී ලංකා පාබල හමුදා මාතාවගේ ඉතිහාස පොතෙහි තවත් ස්වර්ණමය සටහනක් තබන්නට හේතුකාරක වූ දිනයක් උදාවිය. අප අපේ ගෞරවාන්විත ඉතිහාසය පිලිබඳව හැගීම්බරව තෙපලන්නට ආඩම්බර වන්නෙමු. ඉතිහාසයෙන් මුවහත් වූ වර්තමානය පලිගු කැඩපතක් සේ බබලන්නේය. ඉතිහාසයෙන් අනාගතය සුසැදි කළ අනාගතය පිළිබඳව ඇත්තේ ජයගොස නැගිය හැකි ප්‍රභාමත් බලාපොරොත්තුවකි. තවත් විසිපස් වසක් ගෙවුනු කල්හි තවත් ස්වර්ණමය දිනයක් පාබල මාතාවට එළඹෙනු ඇත. ඒ දිනය අද දිනයෙන් සැකසෙන බව සිත්සතන්හි තබා කටයුතු කළ යුතු බැව් සිහිගන්වමි.





*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# ජනාධිපති වර්ණ ප්‍රධාන උත්සවය හා රණවිරු ස්මාරකය විවෘත කිරීමේ උත්සවය නිමිති කොට ගෙන දැක්වූ දායකත්වය වෙනුවෙන් ප්‍රණාමය පුද කිරීම

ශ්‍රී ලංකා යුධ හමුදා ඉතිහාසයේ ආරම්භය සනිටුහන් කල යුධ හමුදා ඒකකය හා රෙජිමේන්තුව ලෙස යටත් විජිත සමය අවසානය සිට මේ දක්වා විශිෂ්ඨ වු රාජකාරි දායකත්වයන් රැසක් ඉටුකල අප ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව එදා මෙදා තුර ශ්‍රී ලංකා මාතාවගේ ඒකීය භාවය,භෞමික අඛණ්ඩතාවය, සාමය, ස්වෛරීත්වය මෙන්ම ව්‍යසනයන්ට ලක්වන සෑම මොහොතකම රට යලිත් සශ්‍රීකත්වයට පත් කිරිමට සිදු කලා වු කැපකිරීම මෙන්ම දසක 03ක කාලයක් පුරා ලංකා මාතාවගේ ඒකීයත්වයට හා සිවිල් ජන ජිවිත වලට ශාපයක්ව පැවැති කුරිරු යුද්ධය නිමා කර රටට සාමයේ අරුණැළු උදා කිරිමට දැක්වු දායකත්වය අගයමින් මීට වසර 37කට පෙර ලබාදී තිබූ ජනාධිපති වර්ණ එවකට ජනාධිපති වූ අතිගරු ජේආර් ජයවර්ධන මැතිතුමන් අතින් ලබාගත් පසු නැවත එම වර්ණ අලුත් කරමින් ජනාධිපති වර්ණ අප රෙජිමේන්තු මධ්‍යස්ථානයට අලුතින් ලබාදෙමින් පලවන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට හා දෙවන ස්වේච්ඡා බලඇණියට ලබා දී තිබු වර්ණ අලුත් කරමින් 2015.10.26 වන දින සුභ මොහොතින් වත්මන් ජනාධිපති තුමන් වන ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිදුන් අතින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේ දී තවත් ඓතිහාසික සිදුවීමක් පාබල හමුදා ඉතිහාසයට එක්කරන ලදී.

තවද මෙම උත්සව අවස්ථාවේ විශේෂිතම කරුණ වන්නේ පාබල ඒකකයකින් ආරම්භ කර දැනට නිත්‍ය ඒකක 15, ස්වේච්ඡා ඒකක 8 ක් හා රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ද සමගින් රෙජිමේන්තුවක් ලෙස රාජකාරි සිදුකරන කාලය තුල රට ජාතිය ආගම වෙනුවෙන් මුල්ම ජීවිත දානය දුන් රණවිරුවාගේ සිට මෑත කාලීනව මානුෂිය මෙහෙයුමේදී තම ජීවිත දානය ලබාදුන් අවසාන සෙබලා දක්වා වූ රණවිරුවන් 3868 දෙනෙකු සදාකල්ම මතකයේ තබන්නට අප රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය තුල දහසක් බාධක මධ්‍යයේ රණවිරුවන්ගේ දැතින්ම නිමකලා වූ දකුණු ආසියා මහද්වීපයේ ඉදිවී ඇති විශාල රණවිරු ස්මාරක අතුරින් තවත් එක් සුවිශේෂී රණවිරු ස්මාරකයක් තැනීමේ සංකල්පය ඉදිරිපත් කරමින් හා එය ආරම්භයේ සිට අවසානය තෙක්ම අධීක්ෂණය කරමින් හා මගපෙන්වමින් එය උසස් මට්ටමින් නිමකර ගැනීමට මුලිකවම කටයුතු කල ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවෙහි හිටපු රෙජිමේන්තු අධිපති හා හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරල් ආර්එම්ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන නිලධාරි තුමන් හට මෙම විශේෂ වයිට් හැකල් කලාපය තුලින් හෘදයංගම ස්තුතිය පුද කරන්නෙමි. එමෙන්ම රණවිරු ස්මාරකයෙහි ගෘහ නිර්මාණ ශිල්පයෙන් දායකත්වය ලබාදුන් ජයම්පති හේරත් මහතා ඇතුලු එම කාර්‍යය මණ්ඩලයටත් මාගේ විශේෂ ස්තුතිය පුද කරමි. තවද මෙම කටයුතු සාර්ථක කරගැනීම සඳහා නන්අයුරින් නිර්මාණශීලි දායකත්වය ලබාදුන් මහත්ම මහත්මීන් හා සිවිල් ආයතන වෙතද ස්තුතිය පුද කරමි. එමෙන්ම මෙම උත්සව අවස්ථාව සඳහා නන් අයුරින් දායකත්වය ලබාදුන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, විශ්‍රාමික ජ්‍යේෂ්ඨ නිලධාරින්, ඒකක අණදෙන නිලධාරිවරුන්, සියලුම නිලයින් හා සිවිල් සේවක මහතුන් වෙතද කෘතඥ පූර්වක ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

කේවීඩීවී කරුණාසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
මේජර් ජෙනරල්
රෙජිමේන්තු අධිපති

# ශ්‍රී ලංකා පාබල හමුදා ආරම්භය

1750 වකවානුවේ බ්‍රිතාන්‍ය ජාතිකයින් උතුරු ඇමෙරිකාවේ බලය ලබා ගැනීමට උත්සාහයක යෙදුනි. එහිදී ඇතිවුන සටන් වලදී රතු ඉන්දියානුවන් සැහැල්ලු ආයුධ භාවිතා කරමින් බ්‍රිතාන්‍ය හමුදාවන්ට පහර දෙන ලදී. බ්‍රිතාන්‍ය හමුදාවන්ගේ අවි ආයුධ ඇඳුම පැළඳුම සහ හිස්වැසුම බරින් වැඩි නිසා අවැසි ආකාරයට සටන් කිරීමට මෙන්ම සැහැල්ලුවෙන් ගමන් කිරිමටද අපහසු විය. බ්‍රිතාන්‍ය හමුදාවන් සටන් වලට පහසු වන සේ හමුදා බණ්ඩ නැවත සැහැල්ලු ආයුධ සහිතව ප්‍රතිසංවිධානය කරන ලදී. එම කරුණු මුල්කරගෙන පාබල හමුදාවන් සැහැල්ලු ආයුධ අතැතිව යන සොල්දාදුවා යන අරුත සහිත ලයිට් ඉන්ෆන්ට්‍රි යන (LIGHT INFANTRY) යෙදුම ලැබිනි.

1861 අප්‍රේල් 11 දින මාතලේ සහකාර ඒජන්ත කාර්යාලයේදී සහකාර ඒජන්ත බ්‍රෝඩි මහතාගේ ප්‍රධානත්වයෙන් මාතලේ ප්‍රදේශයේ ස්වේච්ඡා රයිෆල් රෙජිමේන්තුවක් පිහිටුවා ගැනීම සඳහා වූ මූලික කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව 1861 අංක 03 දරණ ආඥා පනත මගින් බ්‍රිතාන්‍ය මහ රැජිනගේ අනුමැතිය ලැබුණි. උක්ත නියෝගයෙහි ප්‍රකාර 1862 ජූලි මස 02 වන දින ස්වේච්ඡා හමුදාවක් නගා සිටුවීම සඳහා වූ අංක 3326 දරණ විශේෂ ගැසට් පත්‍රය 1862 ජූලි මස 05 වන දින ප්‍රකාශයට පත්කරන ලදි. මේ අනුව 1881 අප්‍රේල් 01 දින දී සිලෝන් වොලන්ටියර්ස් ආරම්භ විය. මෙහි ප්‍රථම අණදෙන නිළධාරී වශයෙන් පත්වූයේ ලුතිතන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ්ය. 1881 අගෝස්තු 06 වන දින සිලෝන් ලයිට් ඉන්ෆැන්ට්‍රි වොලන්ටියර්ස් (Ceylon Light Infantry Volunteers) යන නම නිළ වශයෙන් අනුමත විය.

1881.04.01 වන දින සිලෝන් වොලන්ටියර්ස් නමින් 2 ස්වේච්ඡා ලංකා පාබල හමුදාව බිහිවීම සිදුවිය. (මෙම අනුමැතිය දැන්වීම 1881 අප්‍රේල් මස 01 වන දින රජයේ ගැසට් පත්‍ර අංක 4396 හි 528 වන පිටුවෙන් ප්‍රකාශයට පත්කරන ලදී.) 1881.04.06 වන දින ඒකක ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් බ්‍රිතාන්‍යයේ 21 වන ස්වේච්ඡා ලැන්කෂියර් රයිෆල් බලකායට අයත් ලුතිතන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ් පත්කරන ලදී. 1881.05.30 වන දින ඒකක මුලස්ථානය කොළඹ පිටකොටුවේ කුමාර වීදියේ පිහිටි පැරණි ලන්දේසි ගොඩනැගිල්ලක පිහිටුවන ලදී. මෙම ඒකකයේ 08 ×183 ක් ක්‍රියාන්විතයේදී රටදය වෙනුවෙන් ජීවිත පූජා කළ අතර, තවද 06 × 188 ක් හට තුවාල සිදුවී ඇත.

1890 වර්ෂයේ මෙම ඒකකය තුල ගිලන් මැසි කණ්ඩායම ආරම්භ කරන ලදී. මෙය පසුව ලංකා වෛද්‍ය බලකාය විය.





*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

1949 අංක 17 දරණ යුධ හමුදා පනතින් යුධ හමුදාව නිත්‍ය හා ස්වේච්ඡා වශයෙන් සංවිධානය වීමෙන් ලංකා පාබල හමුදාව ස්වේච්ඡා බළඇණිය නව ලංකා යුධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවේ ඒකකයක් විය. 1950 වසරේද ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය පාබල බළඇණි බිහිවීම සිදුවිය. මේ අනුව 1949 දී නගාලන ලද නිත්‍ය හමුදාවට අයත් "ද සිලෝන් ඉන්ෆන්ට්‍රි රෙජිමන්ට්" නමින් හැඳින්වූ පාබල ඒකකය 1950 මැයි මස 12 වන දින 1 වන බළඇණිය ලංකා පාබල හමුදාව (ලපාහ) (CLI) නමින් නම් කරන ලදී. 1 ලපාහ ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී ලෙස එවකට ලුතිතන් කර්නල් එච්ඩබ්ජී විජේකෝන් ඕබීඊඩී අණදීම භාරගෙන කොළඹ ඇවිලන් බැරැක්කයේ ස්ථානගත වන ලදී. මෙම ඒකකයේ 22 × 396 ක් ක්‍රියාන්විතයේදී රටදය වෙනුවෙන් ජීවිත පූජා කළ අතර, 03 × 107 ක් අතුරුදහන් විය. තවද 55 × 1426 ක් හට තුවාල සිදුවී ඇත.

1954 අප්‍රේල් මස 21 වන දින දෙවන එළිසබෙත් මහ රැජින විසින් කොළඹ ගාලු මුවදොර පිටියේදී නව රාජකීය සම්මාන ධජ ප්‍රදානය කරන ලදී. එම අවස්ථාවේදී පලවන ලංකා පාබල හමුදාව වෙත ප්‍රථම වරටත් දෙවන ස්වේච්ඡා පාබල හමුදා ඒකකය වෙත දෙවෙනි වරටත් සම්මාන ධජ ප්‍රදානය කරන ලදී. 1922 දි මෙම ස්වේච්ඡා ඒකකය වෙත පිරිනමා තිබූ රාජකීය සම්මාන ධජයන් කොළඹ කොටුවේ ශාන්ත පීතර දේවස්ථානයේ ගෞරව සහිතව තැන්පත් කරන ලදී.
1955 වසරේ ලංකා සන්නාහ සන්නද්ධ බළකාය සහ සිංහ රෙජිමේන්තුව ආරම්භ කිරීමට නිලධාරීන් සහ සෙසුනිළයින් 1 ලපාහ ඒකකය වෙතින් ලබා දෙන ලදී.

1972 මැයි 22 දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශ කිරීමෙන් පසුව ලංකා පාබල හමුදාව ශ්‍රී ලංකා පාබල හමුදාව වශයෙන් නම් කරන ලදි. ඒ අනුව එතෙක් භාවිතයට ගත් මහ රැජිනගේ සම්මාන ධජ ගෞරවයෙන් යුතුව ඒකකයෙහි කෞතුකාගාරයේ තැන්පත් කරන ලදී.

1978 ඔක්තෝබර් 10 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක අතිගරු ජනාධිපති ශ්‍රීමත් ජේආර් ජයවර්ධන උතුමාණන් විසින් පනාගොඩ 1 වන ශ්‍රී ලංකා පාබල හමුදා සරඹ භූමියේදී 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත හා 2 වන ස්වේච්ඡා පාබල හමුදා ඒකකය වෙත ජනාධිපති වර්ණ ධජ හා රෙජිමේන්තු වර්ණ ධජ ප්‍රදානය කරන ලදී.

1985.12.16 දින වන විට හටපිරිස් වර්ධනය හා ප්‍රචණ්ඩකාරී වාතාවරණයත් සමග හමුදා නියෝග 2/86 යටතේ 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ උපත 1985.12.16 වන දින තිසාවැව යුධ හමුදා කඳවුරේදී සිදුවිය. 3 ශ්‍රීලපාහ ඒකක ආරම්භ කිරීමට නායකත්වය ලබාදුන් නි/50394 ලුතිතන් කර්නල් එන්ඩීඑම්එම් වික්‍රමරත්න ශ්‍රීලපාහ අණදෙන නිලධාරිගෙන් අණදීම යටතේ 3 ශ්‍රීලපාහ ඒකකය ගොඩනගන ලදී. මෙම ඒකකය ගොඩනැගීම සඳහා 1 ශ්‍රීලපාහ වෙතින් හටපිරිස් අනියුක්ත කරන ලදී. මෙම ඒකකයේ 22 × 512 ක පිරිසක් ක්‍රියාන්විතයේදී රටදය වෙනුවෙන් ජීවිත පූජාකරන ලද අතර, 01 × 34 ක් අතුරුදහන් වන ලදී. පසුව යුධ හමුදාවේ ව්‍යාප්තියත් සමගම මෙම බළඇණිය 1 වෙනි යාන්ත්‍රික පාබල බළඇණිය බවට පත් විය.

1987 මැයි 05 දින ලුතිතන් කර්නල් යූජ් ගුණවර්ධන පීඑස්සී ශ්‍රීලපාහ නිලධාරිගේ අණදීම යටතේ ශ්‍රී ලංකා පාබල හමුදාවේ 4 වන ශ්‍රී ලංකා පාබල හමුදා බළඇණිය පාබල හමුදාවේ තුන්වන නිත්‍ය බළඇණිය ලෙස ත්‍රිකුණාමලය මංකිබ්‍රිජ් කඳවුරේදී ස්ථාපනය කරන්නට යෙදුනි. මෙම ඒකකයේ 23 × 350 ක පිරිසක් ක්‍රියාන්විතයේදී රටදය වෙනුවෙන් ජීවිත පූජාකල අතර, 00 × 30 ක පිරිසක් අතුරුදහන් වන ලදී. තවද 51 × 372 ක පිරිසක් හට තුවාල සිදුව ඇත.

1983 වසර වන විට ශ්‍රී ලංකා පාබල හමුදා ඉතිහාසයේ දෙවන ස්වේච්ඡා බළඇණිය වශයෙන් එවකට පැවති දෙවන විමර්ශන රෙජිමේන්තුව - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය විසුරුවා හැර එම බලකායට අයත්ව සිටි සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් ඇතුලත් කර, 1983 ක් වූ අගෝස්තු මස 15 වන දින මේජර් එස්වී පානබොක්කෙ ශ්‍රීලපාහගේ අණදීම යටතේ 5 (සෙච්) බළඇණිය, ශ්‍රී ලංකා පාබල හමුදාව නව බළඇණියක් ලෙස මහනුවර - පල්ලේකැලේ කඳවුරු භූමියේදී ආරම්භ කරන ලදී. මෙම ඒකකයේ 06 × 169 ක පිරිසක් ක්‍රියාන්විතයේදී රටදය වෙනුවෙන් ජීවිත පූජාකල අතර, 00 × 01 ක් අතුරුදහන් වන ලදී. තවද 00 × 11 ක පිරිසක් හට තුවාල සිදුව ඇත.

1988 වසරේ විජයබාහු පාබල රෙජිමේන්තුව ආරම්භ කිරීම සඳහා 1 ශ්‍රීලපාහ (

ඒකකය වෙතින් නිලධාරි 02 ක් සහ සෙසුනිලයින් 42 ක් එම රෙජිමේන්තුව නගාසිටුවීම සඳහා අනියුක්ත කරන ලදී.

1983 වර්ෂයේ ශ්‍රී ලංකාද්වීපයේ ආරම්භ වූ කළු ජූලිය නොහොත් ජාතිවාදී අරගලයත් සමග ආරම්භ වූ ත්‍රස්ථවාදි ක්‍රියා රට තුල උත්සන්න වීම හේතුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විශාල වශයෙන් ව්‍යාප්ත වීමට පටන් ගැනිනි. එම ව්‍යාප්තියත් සමග බලඇණි වල පරිපාලනමය කටයුතු විධිමත් කිරීම සඳහා සුදුසු මූලස්ථානයක් වශයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදුකරන ලදී.

ඒ අනුව එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාධිපති වශයෙන් කටයුතු කල ලුතිනන් ජෙනරාල් හැමිල්ටන් වනසිංහ විසින් හමුදා චර්යා නියෝග 37/89 හා 1989 ජූනි 30 දිනැති විශේෂ හමුදා චර්යා නියෝග මගින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා නියෝග නිකුත් කරන ලදී. එම නියෝගය අනුව මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය 1989 ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ යුධ හමුදා ජනපදයේ 1 වන පාබල හමුදා බලඇණි මූලස්ථානය පිහිටි ස්ථානයේදී රෙජිමේන්තු ධජය ඔසවා ආරම්භ කරන ලදී.





*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව

1983 වර්ෂයේ ශ්‍රී ලංකාද්වීපයේ ආරම්භ වූ කළු ජූලිය නොහොත් ජාතිවාදී අරගලයත් සමග ආරම්භ වූ ත්‍රස්ථවාදී ක්‍රියා රට තුල උත්සන්න වීම හේතුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විශාල වශයෙන් ව්‍යාප්ත විමට පටන් ගැනිනි. එම ව්‍යාප්තීයත් සමග බළඇණි වල පරිපාලනමය කටයුතු විධිමත් කිරීම සඳහා සුදුසු මූලස්ථානයක් වශයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදුකරන ලදී. ඒ අනුව එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාධිපති වශයෙන් කටයුතු කල ලුතිතන් ජෙනරාල් හැමිල්ටන් වනසිංහ විසින් හමුදා චර්යා නියෝග 37/89 හා 1989 ජුනි 30 දිනැති විශේෂ හමුදා චර්යා නියෝග මගින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා නියෝග නිකුත් කරන ලදී. එම නියෝගය අනුව මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය 1989 ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ යුධ හමුදා ජනපදයේ 1 වන පාබල හමුදා බළඇණි මූලස්ථානය පිහිටි ස්ථානයේදී රෙජිමේන්තු ධජය ඔසවා ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා පාබල හමුදාව අනෙකුත් රෙජිමේන්තු අතුරින් අති විශිෂ්ඨ රෙජිමේන්තුවක් කිරීම අරභයා හිටපු යුධ හමුදාපති වරුන්ගේ හා සියලුම රෙජිමේන්තු අධිපතින් සපයන ලද නායකත්වය අනගිභවනීය වන අතර, වර්ථමාන රෙජිමේන්තු අධිපති වන මේජර් ජෙනරල් කේ්ඩීජ් කරුණාසේකර ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මග පෙන්වීම මත රෙජිමේන්තු මධ්‍යස්ථානයටද, රට වෙනුවෙන් ජීවිත දානය හා කාය දානය ලබාදුන් රණවිරුවන්ට හා ඔහුන්ගේ පවුල්වල සුභ සාධනය මෙන්ම සේවයේ නිරත පාබල බළඇණි සාමාජිකයින්ට සිදුවනුයේ මහගු සේවයකි.

## ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව

1989 ඔක්තෝබර් මස 23



*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*



## රෙජිමේන්තු ලාංඡනය

1881.09.06 දින ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ් විසින් රාජකීය අති උතුම් වේල්සයේ කුමරු වෙතින් බලඇණියේ ගෞරවනීය කර්නල් පදවිය භාරගැනීමට කැමැත්ත විමසන ලදි. එම ලිපිය වේල්සයේ කුමරු විසින් සතුටින් භාරගෙන ඒ සඳහා 1881.11.31 වන දින කැමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම කරුණු මුල්කරගෙන බ්‍රිතාන්‍ය කිරීටයක හෙබවූ පැස්බර පිහාටු තුනකින්ද, යටින් වේල්ස්හි කුමරුගේ ආදර්ශ පාඨය වන ''ඉච් ඩියන්'', (සේවය කරමි) සමන්විත වූ වේල්ස් කුමරුගේ ලාංඡනය මුලින්ම යොදා ගන්නා ලදී.

1910 වකවානුවේදි මෙම ලාංඡනයට පාබල හමුදා සංකේතවත් කරන බියුගලයක්ද CLI අකුරු බැඳි අක්ෂරයන්ගෙන් සමන්විත විය. 1972 දී ලංකාව ජනරජයක් වශයෙන් ප්‍රකාශයට පත්කල විටදී රෙජිමේන්තු ලාංඡනයෙහි සඳහන් පාරිභාෂික අකුරු වල යම් යම් සංකේත වලත් වෙනසක් සිදුවිය. රෙජිමේන්තුවේ අභිමානය ශ්‍රී ලංකා පාබල හමුදාව, යනුවෙන්ද බියුගල් නලාවේ රැහැන් අතර වූ සීඑල්අයි යන අකුරු තුන ඉවත් කොට ඒ වෙනුවට ලපාහ යන සිංහල අකුරු යොදන ලදී. වේල්ස් කුමරුගෙන් ආදර්ශ පාඨය වන ''ඉච් ඩියන්'' යන්න ''සේවය කරමි'' යන සිංහල පරිවර්ථනය යොදා වෙනස් කෙරිණි. ලාංඡනයේ ආකෘතියෙන් වේල්ස් කුමරුගේ ඔටුන්න ඉවත් කෙරිණි. පැස්බර පිහාටු තුන ඉවත් කර හැඩහුරුකමින් ඒවාට සමාන පෙනුමක් ඇති වී කරල් 03 ක් අන්තර්ගත කරන ලදී.

ලංකා පාබල හමුදාවේ ලාංඡනයේ වංශ චිහ්නය වන්නේ බියුගල් නලාවත් එහි රැහැන් අතරින් යෙදුනු ලපාහ, යන සිංහල අකුරු තුනත් සේවය කරමි යන ආදර්ශ පාඨයත්, බියුගල් නලාවේ රැහැන් වලින් බැඳුනු වී කරල්වල පැහැය රන්වන් වන අතර, අනෙකුත් සියල්ලම රජත පැහැයෙන් යුක්ත වේ. මෙසේ නැවත සැලසුම් කරන ලද රෙජිමේන්තු ලාංඡනය ශ්‍රී ලංකා පාබල හමුදාවේ භාවිතා වේ.



## රෙජිමේන්තු වාදනය
## I AM NINETY FIVE
"අයි ඇම් නයින්ටි ෆයිව්"

විලියම් මිලර් විසින් රයිෆල් බ්‍රිගේඩය වෙත හඳුන්වා දෙන ලද ''අයි ඇම් නයින්ටි ෆයිව්'' ගීතයේ අනුවාදනය පිළිබඳව ඔහු මෙසේ ප්‍රකාශ කර ඇත. අප 1846 කේප්හි ස්ථානගතව සිටියදි වෙහෙසකර දිගු පා ගමන් වලින් පසුව සෙබලුන් කඳවුර තුලට රැගෙන ඒමේදී වෙහෙසකර භාවයෙන් මිදීමට ''අයි ඇම් නයින්ටි ෆයිව්'' වාදනය මහත් රුකුලක් වුනා. තවද, මෙම වාදනය I වන කේප් යුද්ධයේදීත් (1846-1848) II වන කේප් යුද්ධයේදීත් (1851-1853) මෙසේ වාදනය කර සෙබලුන්ගේ වෙහෙසකර භාවය මගහරවා ඇත. 1852 දී මෙම වාදනය රයිෆල් බ්‍රිගේඩයේ රෙජිමේන්තු වාදනය ලෙසට යොදාගෙන ඇති බවට ඔහු විසින් ප්‍රකාශ කර ඇත. 95 වන පාබල ඒකකයේ වාදනය වූ බැවිනුත් 1857 වර්ෂයේදී මෙම 95 වන ගමන් වාදනය ලෙස නම් තැබිය යුතු බවට දන්වා ඇති මෙම වාදනය බොහෝ කාලයක් 6 වන ඩ්‍රැගන්ගාඩ්ස් රෙජිමේන්තුව, ෂර්වුඩ් ෆොරස්ටර්ස්, රාජකීය කාලතුවක්කු හමුදාව, 43 වන පාබල හමුදාව (1863), ෂොරෝප්ෂයර් පාබල හමුදාව (1875) වාදනය කර ඇත. එමෙන්ම කැනඩාවේ හේස්ටින්ස් ඇන්ඩ් ප්‍රින්ස් එඩ්වර්ඩ් රෙජිමේන්තුවේ වාදනය ලෙස ''අයි ඇම් නයින්ටි ෆයිව්'' වාදනය වර්තමානයේ වාදනය කරන බැව් සඳහන් වේ.


*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

## ශ්‍රී ලංකා පාබල හමුදා ධජය

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු ධජයේ නිල් පැහැති පසුබිමක් තුල රෙජිමේන්තු ලාංඡනය දක්වා ඇත. 1744 ජර්මනියේ ''පර්සියන් ෆීල්ඩ් හේගර් රෙජිමේන්තුව, මුලින්ම බියුගල් නලාව සිරස්ක ලාංඡනයට යොදාගෙන ඇති අතර, භූමියේ මුහුණට මුහුණලා කරන ලද සටන් වල්දී ඉදිරියෙන්ම ගමන් කරනු ලැබුවේ පාබල හමුදා සෙබලුන්වූ නිසා මෙවැනි සටන් වල්දී නියෝගයන් නිකුත්වූයේ සංඥා ක්‍රම මගිනි. එම සංඥා භූමියේ සටන් කරන්නවුන් හට දෙනු ලැබුවේ බෙර නාද පතුරවමින්ය. මෙය බරින් වැඩි නිසා සටන් භූමියේදී ඒවා හැසිරවීම ඉතා අපහසු කාර්යයක් විය. පසු කාලීනව මෙය ඉවතලා බියුගලය කෙරේ වැඩි සැලකිල්ලක් දක්වන ලදී. මේ ආකාරයෙන් පාබල සෙබල කණ්ඩායම් සමග බියුගලයේ සම්බන්ධතාවය ගොඩනැගුනි. ඒ අයුරින් පාබල හමුදාවේ විකාශය සමග ලාංඡනයක් වශයෙන් මෙය සම්මිශ්‍රනයවී නිර්මාණය විය.

රාජකීය අති උතුම් වේල්සයේ කුමරු වෙතින් බලඇණියේ ගෞරවනීය කර්නල් පදවිය භාරගැනීම හේතුවෙන් වේල්ස් කුමරුගේ ඔටුන්නෙහි ඇති පැස්බර පිහාටු තුනකින්ද, යටින් වේල්ස්හී කුමරුගේ ආදර්ශ පාඨය වන ''ඉච් ඩියන්'' (සේවය කරමි) සඳහන් ලියවිල්ලකින් සමන්විත වූ වේල්ස් කුමරුගේ ලාංඡනය ඒකක ලාංඡනය ලෙස යොදාගන්නා ලදී.

ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමත් සමග වේල්ස් කුමරුගේ ආදර්ශ පාඨය වන “ICH DIEN” යන්න ''සේවය කරමි'' යන සිංහල පරිවර්ථනය යොදා වෙනස් කෙරිණි. ලාංඡනයේ ආකෘතියෙන් වේල්ස් කුමරුගේ ඔටුන්න ඉවත් කෙරිණි. පැස්බර පිහාටු තුන ඉවත් කර හැඩහුරුකමින් ඒවාට සමාන පෙනුමක් ඇති වී කරල් 03 ක් අන්තර්ගත කරන ලදී. මෙම වී කරල් සංකේතවත් වන්නේ උදාර යුධ හමුදාමය ගුණාංග වන යුතුකම, ජාත්‍යාලය සහ ආත්ම පරිත්‍යාගය යන්නයි.

ලංකා පාබල හමුදාවේ ලාංඡනයෙහි සඳහන් වන්නේ බියුගල් නලාවත් එහි රැහැන් අතරින් යෙදුනු ''ලපාහ'' යන සිංහල අකුරු තුනත් ''සේවය කරමි'' යන ආදර්ශ පාඨයත්, බියුගල් නලාවේ රැහැන් වලින් බැඳුනු වී කරල්වල පැහැය රන්වන් වන අතර, අනෙකුත් සියල්ලම රජත පැහැයෙන් යුක්ත වේ. මෙසේ නැවත සැලසුම් කරන ලද රෙජිමේන්තු ලාංඡනය යොදා නිල් පාට පසුබිමකින් යුක්ත රෙජිමේන්තු ධජය අද ශ්‍රීලපාහ රෙජිමේන්තු ධජය ලෙස භාවිතා කරයි.



# රෙජිමේන්තු මංගල හස්තියා - කණ්ඩුල



කණ්ඩුල-I

1961 වර්ෂයේ බළඇණියේ ප්‍රථම මංගල වස්තුව ලෙස නම් කර සිටි සුරතල් මුවාගේ වියෝ වීමත් සමග හස්තියෙකු බඳු තේජමාන වස්තුවක් ඊට වඩා සුදුසු බවට තීරණය කෙරිණි. මේ තීරණය රජයට හා අදාල ආයතන වලට දැනුම් දීමෙන් ටික කලකට පසුව එවකට සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂකව සිටි මේජර් ඕබ්‍රේව් වයිමන් නම් සුදු ජාතිකයා කුඩා අලි පැටවෙකු ලංකා පාබල හමුදාවට ලබාදීමට එකඟ වූයේය. 1961 ජනවාරි මස 02 වෙනිදා මේ අලි පැටවා නිල වශයෙන් පළවන ලංකා පාබල හමුදාව වෙත පරිත්‍යාග කෙරුණි. අලි පැටවෙකු සිය මංගල වස්තුව ලෙස පත්කර ගනිමින් 1 ලපාහ බළඇණි ඉතිහාසයට එක්විය. ලංකාවේ පහල වූ විශිෂ්ඨ රජවරයෙකු වන ගැමුණු මහ නිරිඳුන්ගේ මංගල වස්තුව වූ වීරෝධාර කණ්ඩුල හස්තියාගේ නම මෙම අලි පැටවාට යොදන ලදී. නිසි වයස් එළඹීමෙන් පසු මංගල හස්තියා නව හස්තියෙකුට තමාට පැවරුණ රාජකාරියට ඉඩ දෙමින් කණ්ඩුල හස්ටියා විශ්‍රාම ගැන්වීම සිදුකරන අතර, ඒ අනුව ගෙන එනු ලබන නවක හස්තියාද කණ්ඩුල නම් විය. මේ වන විට රෙජිමේන්තුවේ මංගල හස්තියා ලෙස නම් දරා සිටින්නේ කණ්ඩුල VIII හස්තියා වන අතර, පැවරුණ රාජකාරී වලට අනුගතව පුහුණුව ලබමින් රෙජිමේන්තුව වෙත පැමිණෙන විශේෂ ආරාධිත අමුත්තන් හා රාජ්‍ය නායකයන් පිළිගැනීමට මෙන්ම රෙජිමේන්තුව මගින් සිදුකරනු ලබන සම්මාන පෙළපාලිවලට සහභාගිවීම මංගල හස්තියාට පැවරෙන රාජකාරීන් අතර වේ.

**මිහිතලය මත**
**සිය දෙපයින් නැඟී සිටින්නට**
**මිනිස් වර්ගයා දරූ වෑයමේදී**
**සොබාදහම විසින් මිනිසාට දායාද කරන ලද**
**අතිජාත මිතුරෙකු, ආරක්ෂකයකු මතු නොව**
**සංස්කෘතික දූතයෙකු ද ලෙස**
**උදාර මෙහෙවරක් ඉටු කළ කණ්ඩුල**



## වත්මන් කණ්ඩුල VIII
## පෙළපාලියකට සහභාගී වූ අවස්ථාවක්



*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# ශ්‍රී ලංකා පාබල හමුදාව තුළින් බිහි වූ යුද්ධ හමුදාධිපතිවරුන්

ARMY COMMANDERS PRODUCE BY THE SRI LANKA LIGHT INFANTRY



මේජර් ජෙනරාල්
ඒඑම් මුතුකුමරු ඕබීඊ ඊඩී
Major General
AM Muttukumaru OBE ED



මේජර් ජෙනරාල්
එච්ඩබ්ජී විජේකෝන් ඕබීඊ ඊඩී
Major General
HWG Wijekoon OBE ED



මේජර් ජෙනරාල්
ඒආර් උඩුගම එම්බීඊ
Major General
AR Udugama MBE



මේජර් ජෙනරාල්
බීආර් හයින්
Major General
BR Hyen



ජෙනරාල්
එච්එස්එච් කොට්ටේගොඩ
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීසී
General
HSH Kottegoda WWV RWP RSP USP ndc



ජෙනරාල්
ආර්එම්ඩී රත්නායක
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී
General
RMD Ratnayake WWV RWP RSP VSV USP ndu psc

# රෙජිමේන්තු ආඥාපතිවරුන් සහ රෙජිමේන්තු අධිපතිවරුන්

REGIMENTAL COMMANDERS AND COLONELS OF THE REGIMENT

## Regimental Commanders



බ්‍රිගේඩියර්
එස්එම්ඒ ජයවර්ධන පීඑස්සී
Brigadier
SMA Jayawardena psc
1988.03.01 - 1988.04.04



බ්‍රිගේඩියර්
එම්ටීඩබ් පොන්නම්පෙරුම ආර්එස්පී
Brigadier
MTW Ponnamperuma RSP
1988.04.04 - 1992.08.08



බ්‍රිගේඩියර්
යුඒ කරුණාරත්න පීඑස්සී
Brigadier
UA Karunarathne psc
1992.08.08 - 1993.08.08

***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***



බ්‍රිගේඩියර් ඒකේ ජයවර්ධන
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
Brigadier AK Jayawardhana
RWP RSP psc
1993.08.08 - 1994.12.16



බ්‍රිගේඩියර් එස්එච්එස් කෝට්ටේගොඩ
ආර්ඩබ්පී ආර්එස්පී
Brigadier
SHS Kottegoda RSP
1994.12.16 - 1997.03.25

## රෙජිමේන්තු අධිපතිවරුන්
## Colonels Of The Regiment



බ්‍රිගේඩියර් ඒකේ ජයවර්ධන
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
Brigadier AK Jayawardhana
RWP RSP psc
1997.03.25 - 1998.09.06



මේජර් ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ
ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
Major General SHS Kottegoda
RWP RSP USP ndc
1998.09.06 - 2000.01.01
2001.01.02 - 2003.12.12



මේජර් ජෙනරල්
එන් මල්ලවආරච්චි යූඑස්පී පීඑස්සී
Major General
N Mallawarachchi USP psc
2000.01.01 - 2001.01.01
2003.12.12 - 2007.01.29



මේජර් ජෙනරල් ආර්එම්ඩී රත්නායක
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී
Major General RMD Ratnayake
WWV RWP RSP VSV USP ndu psc
2007.01.29 - 2007.05.20
2009.07.16 - 2013.08.01



මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර
ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී
Major General KADA Karunasekare
RSP VSV USP ndu psc
2007.05.20 - 2009.07.16
2013.08.01 Up to Now



***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***

# රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකවරුන්
# Regimental Center Commandants



කර්නල්
එස්එච්එස් කොට්ටේගොඩ
ආර්ඩබ්පී ආර්එස්පී
Colonel
SHS Kottegoda RWP RSP
1991.04.01 - 1993.06.27



ලුතිතන් කර්නල්
ඩී රත්නසභාපති ආර්එස්පී
Lt Col
D Rathnasabapathy RSP
1993.06.27 - 1993.12.01



ලුතිතන් කර්නල්
ඩීජීඑස් බල්තසාර්
Lt Col
DGS Balthazaar
1993.12.01 - 1994.02.11
1995.07.15 - 1996.03.28



ලුතිතන් කර්නල්
ඩබ්එම්ආර් විජේසුන්දර
ආර්එස්පී පීඑස්සී
Lt Col WMR
Wijesundara RSP psc
1996.03.28 - 1996.12.23



කර්නල්
ටීටීආර් ද සිල්වා
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
Colonel
TTR De Silva RWP RSP psc
1994.02.11 - 1994.11.08
1995.01.04 - 1995.07.15



කර්නල් ජීබීඩබ්ලිව්
ජයසුන්දර ආර්එස්පී
Colonel
GBW Jayasundara RSP
1994.11.08 - 1995.01.04



කර්නල්
ජේඑස් මාසක්කාර ආර්එස්පී
Colonel
JS Masakkara RSP
1996.12.23 1999.01.14
2002.08.27 2005.05.01



කර්නල්
කේඒඩීඒ කරුණාසේකර
ආර්එස්පී පීඑස්සී
Colonel
KADA Karunasekara RSP psc
1999.01.16 - 2000.02.08
2005.05.01 - 2006.01.16



කර්නල් ආර්එම්ඩී රත්නායක
ආර්ඩබ්පී ආර්එස්පී
Colonel
RMD Rathnayake RWP RSP
2000.03.03 - 2000.09.07
2001.09.04 - 2002.08.27



ලුතිතන් කර්නල්
පීපී ද සිල්වා ඩබ්ඩබ්වී
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
Lt Col
PP de Silva WWV RWP RSP psc
2000.09.18 - 2001.09.24



කර්නල් ඩබ් වීරක්කොඩි
Lt Col
W Weerakkody
2006.01.16 - 2006.02.15
2007.08.16 - 2008.04.02



බ්‍රිගේඩියර් ඩීඒ අමුණුගම
ආර්ඩබ්පී ආර්එස්පී
Brigadier DA Amunugama
RWP RSP
2006.02.15 - 2007.06.29
2007.06.29 - 2007.08.16

*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*



කර්නල් ඒඑල්එස්කේ පෙරේරා
ආර්එස්පී
Colonel
ALSK Perera RSP
2008.04.15 - 2008.08.29



ලුතිතන් කර්නල්
ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පී
Lt Col J Thanthiriwatta RWP
2008.08.29 - 2008.12.08



කර්නල්
ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පී
Colonel
TJ Kodituwakku RWP
2008.12.08 - 2009.08.01
2009.08.01 - 2010.09.23



බ්‍රිගේඩියර් කේජේ ජයවීර
ආර්ඩබ්පී ආර්එස්පී
Brigadier
KJ Jayaweera RWP RSP
2010.09.23 - 2013.03.01
2013.03.01 - 2013.08.21



බ්‍රිගේඩියර්
සිඩී වීරසූරිය ආර්එස්පී
Brigadier
CD Weerasuriya RSP
2013.08.21 - 2014.06.25
2014.06.25 - 2015.05.14



බ්‍රිගේඩියර්
එම්එම් කිත්සිරි ආර්එස්පී
Brigadier
MM Kithsiri RSP
2015.05.14 - up to now

## රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන මාණ්ඩලික නිලධාරී
## Regimental Chief Of The Staff



කර්නල් සිඩී වීරසූරිය ආර්එස්පී
Colonel CD Weerasuriya RSP
2012.07.25 - 2013.08.21



කර්නල් ඒඑස් වික්‍රමසේන
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
Colonel AS Wickramasena
RWP RSP psc
2013.08.21 - 2014.11.10



*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# රෙජිමේන්තු මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායකවරුන්
# Regimental Deputy Commandants



කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සි
Colonel AS Wickramasena RWP RSP psc
2014.11.10 - 2015.01.19



කර්නල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී
Colonel GMN Perera RWP RSP
2015.01.19 up to now

## රෙජිමේන්තු මධ්‍යස්ථාන්යේ විධායක අධිකාරිවරුන්



රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රථම විධායක අධිකාරී
මේජර් සීකේපී පුංචිහේවා
1989.10.23 1990.10.01

කපිතන් එච්පී වීරක්කොඩි
1990.11.26 - 1991.03.01
මේජර් එල්බී තල්ගහගොඩ
1990.10.01 - 1990.11.26
මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී
1991.04.25 - 1992.01.15
මේජර් ඩබ්එම්ආර් වීජේසුන්දර
1992.01.15 - 1992.03.10
කපිතන් එස්කේජීඑන්බී ඇහැලමල්පේ
1992.03.10 - 1992.11.01
කපිතන් එච්කේඑස් ප්‍රනාන්දු ආර්ඩබ්පී
1992.11.01 - 1993.03.01
1993.06.22 - 1993.09.10
කපිතන් ජේසී මල්පහන
1993.03.01 - 1993.06.22
මේජර් එච්ඩබ් හේවාආරච්චි ආර්ඩබ්පී
1993.09.10 - 1994.03.08
මේජර් එස්එම්ඩීඩබ්එස්කේ සේනරත්
1994.03.08 - 1994.04.16
මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු
1996.02.25 - 1996.06.24
මේජර් ඩී හෙට්ටිආරච්චි ආර්ඩබ්පී
1998.11.01 - 2000.01.03
මේජර් එච්ඩීජී රණසිංහ
2000.01.03 - 2003.11.03

මේජර් එල්ආර් ශාන්තනම්
2003.11.03 - 2004.08.05
මේජර් ජීඑම්සීකේබී ඒකනායක ආර්එස්පී පිඑස්සී
2004.08.05 - 2007.01.14
මේජර් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්පී
2007.01.14 - 2007.09.20
මේජර් ඩියු ද ලැනරෝල් ආර්ඩබ්පී
1994.04.16 - 1996.01.01
මේජර් කේජේ ජයවීර
1996.01.01 - 1996.02.25
1996.06.24 - 1998.11.01
මේජර් එච්එම්යූ හේරත් ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
2007.09.20 - 2008.02.15
මේජර් එම්සීඑස්කේ සේනාරත්න ආර්එස්පී
2008.02.15 - 2009.04.20
මේජර් එම්පීඑස්පී කුලසේකර
2009.04.20 - 2009.11.23
මේජර් කේජ් පුෂ්ප කුමාර ආර්එස්පී පීඑස්සී
2009.11.23 - 2012.05.02
මේජර් ඩබ්කේඑස්පීඑම්ආර්ඒබී දොඩම්වල පීඑස්සී
2012.05.02 - 2014.03.10
මේජර් ටීඩබ්සීඩීඑම් අමරසිංහ පීඑස්සී
2014.03.10 - 2015.03.09
මේජර් කේවයි ප්‍රියදර්ශන ආර්එස්පී පීඑස්සී
2015.03.09 සිට

# රෙජිමේන්තු සැරයන් මේජර්වරුන්
# Regimental Sargent Majors



**රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රථම රෙජිමේන්තු සැරයන් මේජර්**
**බනි 1 බීඑච් චන්ද්‍රසේන ආර්එස්පී**
WO I BH Chandrasena RSP
1989.10.23 - 1993.04.08

| | |
|---|---|
| බනි 1 කේජී ආරියරත්න | -1993.04.08 - 1994.03.03 |
| බනි 1 ඩබ්එල් ගුණසිරි | -1994.03.03 - 1996.03.12 |
| බනි 1 ඩීඑම්ඩී දසනායක (ආර්එස්පී) | -1996.03.12 - 2000.06.02 |
| බනි 1 ජ්කේ නානායක්කාර (ආර්එස්පී) | -2000.06.02 - 2001.05.10 |
| බනි 1 ආර්එම් කරුණාරත්න (යූඑස්පී) | -2001.05.10 - 2002.05.17 |
| බනි 1 ඩබ්එම් වික්‍රමසිංහ (ආර්ඩබ්පී ආර්එස්පී) | -2002.05.17 - 2003.03.06 |
| බනි 1 ජේඑම් ජයසිංහ බන්ඩා | -2003.03.06 - 2004.02.27 |
| බනි 1 එන්පී වර්ෂකෝන් | -2004.02.27 - 2005.03.18 |
| බනි 1 ඩීජීපී වානගුරු (යූඑස්පී) | -2005.03.18 - 2006.04.20 |
| බනි 1 ජ්එම් විමලරත්න ( ආර්එස්පී) | -2006.04.20 - 2006.08.31 |
| බනි 1 ඕජීජ් වීරසිංහ | -2006.08.31 - 2007.05.04 |
| බනි 1 එස්එච් ගාමිණී | -2007.05.04 - 2008.02.10 |
| බනි 1 එච්පී ප්‍රේමරත්න | -2008.02.10 - 2008.11.05 |
| බනි 1 එස්එස්කේ එදිරිසිංහ (ආර්එස්පී) | -2008.11.05 - 2010.08.18 |
| බනි 1 ඩබ්එම් සෙනෙවිරත්න | -2010.08.18 - 2011.02.24 |
| බනි 1 ජේපීඑම්බියූ ජයවර්ධන | -2011.02.24 - 2012.01.27 |
| බනි 1 ටීජ් පුෂ්ප කුමාර (යූඑස්පී) | -2012.01.27 - 2013.03.06 |
| බනි 1 ඩීඑම්එල් හේරත් (ආර්එස්පී යූඑස්පී) | -2013.03.06 - 2014.07.11 |
| බනි 1 ඩබ්පීපී චමින්ද (යූඑස්පී) | -2014.07.11 - 2015.03.23 |
| බනි 1 කේඑම්ඩීබී කහවත්ත (ආර්එස්පී) | -2015.03.23 සිට මේ දක්වා |



*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# 1 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඉතිහාසය

ලංකා පාබල හමුදා ඉතිහාසය 1948 ට පෙර යටත් විජිත කාලය දක්වා දිවෙන්නක් වන අතර, 1861 මැයි මස 25 වන දින පාබල හමුදාව පිහිටුවීමේ මූලික කටයුතු ආරම්භ විය. ඉන්පසු බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ ඒකකයක් වශයෙන් ස්ථාපිත වූ පාබල හමුදාව ''සේවය කරමි'' (ICH DIEN) යන ආදර්ශ පාඨය යටතේ ස්වකීය ගමන අරඹන ලදී. මෙසේ පිහිටුවන ලද ලංකා පාබල හමුදාව ක්‍රි:ව: 1900 දී සුප්‍රකට ''බෝයර්'' යුද්ධයට දකුණු අප්‍රිකාවේදී සහභාගී විය. එසේම බ්‍රිතාන්‍ය ධජය යටතේ 1914-1918 සමයේ පැවති පළමුවන ලෝක මහා සංග්‍රාමයේ මිත්‍රපාක්ෂික හමුදාව යටතේ මනා සේවයක් ඉටුකරන ලදී.

1948 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාව ස්වාධීන රාජ්‍යයක් වශයෙන් බ්‍රිතාන්‍ය කිරීටයෙන් නිදහස ලැබුණි. එතෙක් ලංකාව තුල බ්‍රිතාන්‍ය පාලනය යටතේ වූ යුධ හමුදාවක් පැවතියත්, නිදහස් ලංකාවට ස්වකීය අනන්‍යතාවයෙන් යුත් යුධ හමුදාවක අවශ්‍යතාවය මත 1949 ඔක්තෝබර් මස 10 වන දින ලංකා යුධ හමුදාව පිහිටුවනු ලැබූ අතර, ඒ සමගම ස්ථිර පාබල හමුදාවක්ද පිහිටුවන ලදී. මෙම ඒකකය ලංකා පාබල රෙජිමේන්තුව නමින් නම් කරන ලදී. 1950 ජූනි මාසයේ යුධ හමුදා ඒකකයන් හැඳින්වීමේ නම්වල වෙනසක් ඇති කිරීමේ ප්‍රතිඵලය ලෙස ලංකා පාබල රෙජිමේන්තුව 1 වන බළඇණිය ලංකා පාබල හමුදාව වශයෙන් නැවත නම් කරනු ලැබුණි. 1949 ඔක්තෝබර් මාසයේ සිටම ඒකකය වෙත පත්කිරීම් සිදුකරනු ලැබූවත් අණදෙන නිලධාරීගේ ප්‍රථම ඒකක නියෝග 1 වන කොටස පළවූයේ 1950 මැයි මස 12 වන දින බැවින්, සෑම වසරකම මැයි 12 වන දින බළඇණි දිනය වශයෙන් සිහිපත් කරනු ලබයි. 1949 ඔක්තෝබර් 10 වන දින ලුතිතන් කර්නල් එච්ඩබ්ජී විජයකෝන් ඕබීඊ ඊඩී ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් වැඩ භාරගන්නා ලද අතර, බළඇණිය මුලින්ම කොළඹ ඇවිලන් චතුරශ්‍රයේදී ස්ථානගත වන ලදී.

ක්‍රමයෙන් පරිණත රණ ඒකකයක් වශයෙන් අභිෂේක ලබමින් 1950 ඔක්තෝබර් මස සිට මාස 2 1/2 ක කාලයක් බ්‍රිතාන්‍යයේ විශේෂ උපදේශක කණ්ඩායමක් මගින් රීදීගම ප්‍රදේශයේදී ඒකකයේ සියලුම කණ්ඩායම් වෙත වන සටන් පුහුණුව ලබාදෙන ලදී.

ශ්‍රී ලංකාවේ යුධ හමුදාව ප්‍රථම වරට රට තුළට අනවසරයෙන් පැමිණෙන්නන් හා හොරබඩු ජාවාරම් මැඩලීම සඳහා යෙදවූ අතර, මෙම ඒකකය සහභාගී වූ ප්‍රථම ක්‍රියාන්විතය මොන්ටි ක්‍රියාන්විතය ලෙස හඳුන්වනු ලැබිණි. ලංකා පාබල හමුදාවේ තවත් නව පිටුවක් පෙරළමින් 1953.07.10 වන දින එතෙක් මූලස්ථානය පැවති ඇවිලන් චතුරශ්‍රයේ සිට ස්වකීය නව වාසස්ථානය වන පනාගොඩ වෙත පැමිණ ස්ථානගත විය.

මෙසේ ස්ථානගතවූ බළඇණියට 1954 අප්‍රේල් මස 21 වන දින බ්‍රිතාන්‍යයේ දෙවන එලිසබෙත් මහ රැජිණ විසින් මෙම ඒකකය සිදුකරන ලද කීර්තිමත් රාජකාරී හේතුකොටගෙන ගාලු මුවදොර පිටියේදී රාජණීය වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කළාය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට වර්ණ ලැබීමෙන් පසු පළවන ලංකා පාබල හමුදාව විසින් 1954.10.06 වන දින බම්බලපිටිය පොලිස් උද්‍යානයේදී වර්ණ ධජ පෙළපාලියක් පවත්වන ලදී. එහිදී ආණ්ඩුකාර ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මැතිඳුන් ආචාරය පිළිගත් අතර, ඒ සඳහා අග්‍රාමාත්‍යතුමා සහ යුධ හමුදාධිපති ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි විය.

1960 වසරේ පළවන ලංකා පාබල හමුදාවේ ප්‍රථම අණදෙන නිලධාරී වූ මේජර් ජෙනරාල් එච්ඩබ්ජී විජේකෝන් ඕබීඊ ඊඩී යුධ හමුදාපති වශයෙන් වැඩ භාරගන්නා ලදි. මෙම වකවානුව වන විට මෙම රෙජිමේන්තුවේ මංගල වස්තුව වශයෙන් කිසියම් සලකුණක් නොමැති වීම මහත් අඩුපාඩුවක්ව පැවති අතර, අණදෙන නිලධාරී විසින් ඒ සඳහා සුදුසු අවස්ථාව බලමින් පසු වූයේය. දෙහිවල සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂක මේජර් ඕබි වින්මන් විසින්, රඹෑපිටියේදී අල්ලා ගන්නා ලද ඇත් පැටවකු අණදෙන නිළධාරී විසින් මහත් පරිශ්‍රමයකින් පසුව ඒකකය වෙත ලබා ගන්නා ලද අතර, එම ඇත් පැටවා පළවන ලංකා පාබල හමුදාවේ මංගල වස්තුව වශයෙන් ''කණ්ඩුල'' ලෙස නම් තබා ලබා ගන්නා ලදී.

1954 දී පළවන ලංකා පාබල හමුදාවට ප්‍රදානය කරන ලද රාජිණී වර්ණ අවසන් වරට 1971.02.04 වන දින කොළඹ ගාලු මුවදොර පිටියේදී පැවති නිදහස් දින පෙළපාලියට රැගෙන යන ලදී. ලංකාව ජනරජයක් කිරීමට පෙර අවසන් වරට රාජිණී වර්ණ උත්සවයකදී භාවිතා කරන අවස්ථාව මෙය වූ අතර, 1974.11.29 දින ඒවා කෞතුක වස්තූන් වශයෙන් අනාගත පරම්පරාවට දැක බලා ගැනීමට හැකිවන පරිදි බළඇණි කෞතුකාගාරයේ ගෞරවයෙන් යුතුව තැන්පත් කරන ලදී. සාමාන්‍යයෙන් පැරණි වර්ණ ධජ පූජනීය ස්ථානයක තැන්පත් කිරීම චිරාගත සම්ප්‍රදාය වූවත්, එහි නියම ආරක්ෂාව තකා කෞතුකාගාරයේ තැන්පත් කරන ලදී.

1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ක්‍රියාත්විත රාජකාරි සඳහා ස්ථානගතව සිටි අතර, මෙම බළඇණියේ ''සී'' කණ්ඩායම ගුරුනගර් හමුදා කඳවුරට අනියුක්තව රාජකාරී යෙදි සිටින ලදී. ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ''සී'' කණ්ඩායමේ භටපිරිස් 1983 ජූලි 23 වන දින පා මුර සංචාරයන් සඳහා කණ්ඩායම් මූලස්ථානයෙන් පිටත් වන ලදී. ශ්‍රී ලංකා ඉතිහාසයේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග කරනු ලැබූ සටනේ තීරණාත්මක සංධිස්ථානයක් වූ මෙම සිදුවීමෙන් මෙම ඒකකයට අයත් නිලධාරී 01 ක් සහ සෙසු නිලයන් 12 දෙනෙකු ජීවිතක්ෂයට පත්වන ලදී.

## පාබල හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හා සෙසු සොල්දාදුවන් 12 දෙනෙකු ජීවිතක්ෂයට පත් වූ එම පා මුර සංචාරයට සහභාගී වූ භඩ පිරිස

නි/50945 2/ලුතිනන් ඒපීඑන්සී ද වාස් ගුණවර්ධන ශ්‍රීලපාහ - අණදෙන්නා
සෙ/10859 ව/සැරයන් වේලකරත්න එස්ජී
සෙ/11000 සැරයන් ප්‍රේරා ජීජී
සෙ/11401 කෝප්‍රල් පෙරේරා ජීආර් (ට්‍රක් රථයේ රියදුරු)
සෙ/11177 කෝප්‍රල් පෙරේරා ආර්ජ්යු
සෙ/10627 ලාකෝ ප්‍රනාන්දු ජ්ආර්
සෙ/11285 ලාකෝ සුමතිපාල අයිඑච්
සෙ/11451 ලාකෝ මානපිටිය ඩීඑම්ජ්ඩී
සෙ/11573 ලාකෝ සුනිල් එම්බී
සෙ/11647 ලාකෝ කරුණාරත්න කේඩී
සෙ/11664 ලාකෝ රාජතිලක එස්පීජී
සෙ/11473 ලාකෝ රොබට් බී
සෙ/11541 ලාකෝ අමරසිංහ එස්එස්
සෙ/11637 ලාකෝ විජේසිරි බීජී
සෙ/82274 ලාකෝ මනතුංග කේආර්ජ්
(ශ්‍රීලයුසේබ - ජීප් රථයේ රියදුරු)

ත්‍රස්තවාදීන්ට එරෙහිව දියත් කරනු ලැබූ උතුර මුදා ගැනීමේ මානුෂීය මෙහෙයුමට 2006 වර්ෂයේදී සහභාගී වී මන්නාරම, යාපනය, මුහමාලෙයි, අරියාලේ, නගර්කෝවිල්, කෙවිල්, චුන්ඩිකලම්, වලෙයි, පුදුමාතලන් හී බලය අත්පත් කර ගනමින් 2009.05.18 වන දින විජයග්‍රහනය සමරණ තෙක්ම මෙම ඒකකය සක්‍රියව දායක වී ඇත. බළඇණිය 2010.07.07 දින පනාගොඩ ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙහි ස්ථානගත වන ලදී. මෙහිදී විශේෂ ප්‍රභූ ආරක්ෂා කිරීමේ රාජකාරී, වැදගත් ස්ථාන ආරක්ෂා කිරීමේ රාජකාරී, ප්‍රජා සත්කාර කටයුතු, පොදු මහජන කටයුතු මෙම ඒකකය විසින් සිදුකරන ලදී. වර්තමානයේ මෙම ඒකකය 53 වන සේනාංකයට අනියුක්තව යුධ හමුදාධිපතිතුමාගේ අතිරේක බළඇණියක් ලෙස පාබල හමුදා රෙජිමේන්තුව තුළ රාජකාරි කරනු ලබන අතර, ඒකකයේ අණදීම ලුතිතන් කර්නල් ඩීඑල්යු තාබ්‍රෘ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් සිදුකරනු ලබයි. ඒකකයේ වසර 65 ක ඉතිහාසය තුළ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මව්බිම වෙනුවෙන් 24 x 508 රණවිරුවන් තම ජීවිතය පූජා කර ඇති අතර, නිලධාරි සහ සෙසුනිලයන් 1480 ක් පූර්ණ ආබාධිත හා ආබාධිත තත්ත්වයට පත්ව ඇත.


*Published by*
*Regiment Centre Sri Lanka Light Infantry*

# ආරම්භයේ සිට මේ වන තෙක් සිටි අණදෙන නිලධාරීන්



ලුතිතන් කර්නල්
එච්ඩබ්ජී විජේකෝන් ඕබීඊ ඊඩී
1950-05-12 සිට 1953-12-31



කර්නල්
ඒචම් මුතුකුමාරු ඕබීඊ ඊඩී ඒඩීසී
1954-01-01 සිට 1955-02-08



ලුතිතන් කර්නල්
බීආර් හයින්
1955-02-08 සිට 1959-11-14



කර්නල්
වීආර් උඩුගම එම්බීඊ
1959-11-14 සිට 1962-11-30



ලුතිතන් කර්නල්
එම්ජ් ජයවීර
1962.12.01 සිට 1965.11.04



ලුතිතන් කර්නල්
ඊවී ද ඉසෙඩ් අබේසේකර
1965.11.05 සිට 1969.02.10



ලුතිතන් කර්නල්
ඒපීආර් ඩේවිඩ් පීඑස්සී
1969.02.11 සිට 1970.07.14



ලුතිතන් කර්නල්
එච්වී අතුකෝරාල ශ්‍රීලපාහ
1970.07.15 සිට 1976.02.29



ලුතිතන් කර්නල්
සීඒඑම්එන් සිල්වා ශ්‍රීලපාහ
1976.03.01 සිට 1979.05.01



ලුතිතන් කර්නල්
එස්එම්ජ් ජයවර්ධන
පීඑස්සී ශ්‍රීලපාහ
1979.05.01 සිට 1981.01.14



ලුතිතන් කර්නල්
ටීඑම් රජුඩීන් ශ්‍රීලපාහ
1981.01.15 සිට 1982.04.04



ලුතිතන් කර්නල් එම්ටීඩබ්
පොන්නම්පෙරුම ශ්‍රීලපාහ
1982.04.04 සිට 1983.08.22



ලුතිතන් කර්නල්යූඒ
කරුණාරත්න
යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ
1983.08.22 සිට 1984.06.10



ලුතිතන් කර්නල් ජීඑම්යූ
සෙනෙවිරත්න ශ්‍රීලපාහ
1984.06.10 සිට 1986.07.31



ලුතිතන් කර්නල් ඒකේ ජයවර්ධන
ආර්ඩබ්පී ආර්එස්පී
පීඑස්සී ශ්‍රීලපාහ
1986.08.01 සිට 1987.12.31



ලුතිතන් කර්නල්
සීඑල් විජයරත්න
පීඑස්සී එම්බීඅයිඑම් ශ්‍රීලපාහ
1988.01.01 සිට 1988.08.08

***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***



ලුතිතන් කර්නල්
සීජේ රණවීර
ආර්එස්පී ශ්‍රීලපාහ
1988.08.08 සිට 1991.01.31



කර්නල් ටීටීආර් ද සිල්වා
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
1991.01.31 සිට 1994.03.10



ලුතිතල් කර්නල්
එච්ඩබ් හේවාආරච්චි
ආර්ඩබ්පී ආර්එස්පී
පීඑස්සී ශ්‍රීලපාහ
1994.03.10 සිට 1997.07.25



මේජර් ආර්ඒඑන්පී ද අල්විස්
ආර්එස්පී ශ්‍රීලපාහ
1997.07.25 සිට 2000.08.25



මේජර් එම්ඒඑම්අයි
මුණසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ
2000.08.25 සිට 2004.10.04



ලුතිතන් කර්නල්
කේජේ ජයවීර
ආර්එස්පී ශ්‍රීලපාහ
2004.10.04 සිට 2006.04.22



ලුතිතන් කර්නල්
කේඩබ්ආර් ද ආබෲව්
ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ
2006.04.22 සිට 2008.08.31



ලුතිතන් කර්නල්
සී රණවීර ආර්එස්පී ශ්‍රීලපාහ
2008.08.31 සිට 2009.10.17



ලුතිතන් කර්නල්
ඩබ්එස්කේ ලියනවඩුගේ ශ්‍රීලපාහ
2009.10.17 සිට 2013.01.10



ලුතිතන් කර්නල් ඩීඑල්යූ තාබෘ
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ
2013.01.10 සිට මේ දක්වා



***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***

**Major General UA Karunaratne USP psc**
5, Dickmans Road, Colombo 5

30th September 2015

Major General KADA Karunasekara RSP VSV USP ndu
Colonel of the Regiment
Sri Lanka Light Infantry

Dear General,

All of us, past and present members of the SLLI family who were fortunate to attend the twin ceremonies, the presentation of the Colours and the ceremonial opening of the Monument witnessed the ceremonies with a sense of personal pride. 26th October 2015 will be etched in our memories as the most memorable day of the SLLI Regiment in its peace time history and will be remembered for a long time to come.

The excellent bearing and conduct of the troops, not to mention, the meticulous execution of the drill were appreciated by all.

The colourfull opening of the Monument was conducted with dignity and decorum as befitting our Regiment. This impressive edifice encapsulated the spirit of the Regiment.We are aware that the monument project which was entirely funded by private sources and 95% of the manual work was executed by our own personal which display the character of the Regiment.

I am aware of the amount of hard work and sleepless nights that you and your staff had to undergo to complete this project. In this moment of glory, I wish to congratulate you, Regimental Centre Commandant Brigadier MM Kithsiri RSP, Parade Commander Brigadier MP Gunasinghe RSP and all the others who helped to make this occasion a memorable one.

**"UDARAI OBA"**

Yours ever,

U.A. K

Former Regimental Commander




**THE PRESIDENT'S AND REGIMENTAL COLOURS**
of the
1st Battalion, The Sri Lanka Light Infantry
to be Presented by
**His Excellency J.R Jayewardene**
President of the Democratic Socialist Republic of Sri Lanka
on 10th October 1978

***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***



# 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ පිළිබඳ ඉතිහාසය

පැරණි ශිෂ්ඨාචාරයන් හී එවකට විසූ මිනිසුන් "සලකුණ" වශයෙන් යම් යම් දෑ පාවිච්චි කළ බවට වාර්තා සුලබය. ඊජිප්තු යුද්ධ හමුදාවේ කණ්ඩායම් කිහිපයකට ඔවුනට විශේෂ වූ ධජ තිබූ බව පැරණි ලේඛකයන් විසින් ඉදිරිපත් කරන ඔවුන්ගේ කැටයම් හා චිත්‍ර වලින් පෙනේ. භටයින්ගේ සිත් තුළ පහල වූ භක්තිය හා ඇල්ම අනුව මෙම ධජ පිළියෙල වූ බවට දැනට ලැබී ඇති තොරතුරු අනුව සිතා ගත හැකිය. ශුද්ධ සතුන්, බෝට්ටු සළකුණු හෝ රූප, රජෙකුගේ අඩංගු නැටියක්, පවානක් හා පිහාටු වැනි සංකේත ආදිය යෂ්ඨියක් ධජ ලෙස නංවන අතර, එවැන්නක භාරකාරයා වීම විශේෂ වරප්‍රසාදයක් හා ගරුත්වයක් ලෙස පිලිගනු ලැබීය. මේ හා සමාන සිරිතක් ඇසිරියන්වරුන් හා යුදෙව්වන් අතර පැවතිණ. ඊජිප්තු හා ඇසිරියන්හි උදාහරණයන්හි, සළකුණු දරා සිටින යෂ්ටිය කුඩා කොඩිවැල් වලින් සරසා තිබුණ පටු කොඩි ධජ හා සංකේත පිළිබඳ බයිබලයේද සදහන් වේ. කිසියම් රෙදි වර්ගයකින් පිළියෙල කළ බව පෙනෙන්නට තිබුණු නිර්භීත යුධ හමුදා භටයින් විසින් ඉතා ප්‍රවේශමෙන් ආරක්‍ෂා කළ පර්ෂියන්වරුන්ගේ ධජ වල හෙල්ලයක අග කොටස සවිකරන ලද රාජ අලියෙකුගේ රූපයක්ද ඔවුන් දේවත්වයෙන් සළකන ලද සූර්යයාද ඇතුලත් විය.

අද අප අතර, තිබෙන වර්ණ වල ඇති සදාචාර හා ලයාන්විත වැදගත්කම එදා රෝම යුධ හමුදාවේ රාජාලියා, පුෂ්ප, ධජ ආදි සංකේත වලද සැගවී තිබිණ. රෝම ධජ, රෝමයේ පල්ලිවල පූජනීය වස්තු ලෙස සලකා ආරක්‍ෂා කරන ලදී. සිය සළකුණට රෝමවරුන්ගේ ගරුත්වය හා අනෙක් ජාතින් අතර, ඔවුන් උසස් යන හැගීම ඔවුන්ට යුද්ධයේදී ජය ලැබීමට ඉවහල් විය. ඔවුනට ඇති ඉතාම පූජනීය වස්තුව එය බැව් සිහිපත් කරවමින් සිය සෙබලුන් සතුරාට පහර දෙමින් ඉදිරියට යාමට අමුතු ධෛර්යයක් ලබා දීම වස් සේනාධිපතියෙකු විසින් ධජ සතුරා දෙසට එල්ල කිරීම පුදුම උපදවන කරුණක් නොවීය.

යුධ පෙරමුණේ භටපිරිස් බරපතල ලෙස තුවාල ලබා අඩපන වූ අවස්ථාවන්හී වර්ණ ධජ සටන් පෙරමුණට ගෙන ඒමෙන් සෙබලුන්ගේ චිත්ත ධෛර්ය නංවා එම සටන් වලින් ජයගත් අවස්ථා ඉතිහාසයේ විරලව දැකිය හැකිය. මෙම හේතූන් වලින් වර්ණ ධජ පිළිබඳ සෙබළා තුළ ඇති ගෞරවය මනාව පිළිඹිබු වේ.

ආගමික පෙරහැරවල්හී අලංකාරත්වය වැඩි දියුණු කරලීම වස් එංගලන්තය මුලදි පටු කොඩි පාවිච්චි කරන ලදී. වැදගත් අනුස්මරණ උත්සව

වලදී ප්‍රදර්ශනය කිරීම සඳහා පටු කොඩි තිබුණු අතර, ඇතැම් අවස්ථාවලදී යුධ කටයුතු සඳහා ඒවා ලබා දෙනු ලැබීය. පටු කොඩි මධ්‍ය යුගයේදී හමුදාව සහ ආගමික යුධ කටයුතු සහ ආගමික හැඟීම් සහ ලයාන්විත භාවයන් සම්බන්ධ කරන පුරුකක් වශයෙන් පැවතුණි. මෑත යුගයේදී පවා මෙය දක්නට පුළුවන.

හමුදා වර්ණ යනු ඒ ඒ රෙජිමේන්තුවේ හා බලඇණි විසින් දරනු ලැබූ පටුකොඩි වලට යොදන ලද නාමයයි. බ්‍රිතාන්‍ය යුධ හමුදාවේ මුර හා සන්නද්ධ බලඇණි, එක් බලඇණියක් වර්ණ දෙකක් බැගින් එනම්, රජුගේ හා රෙජිමේන්තු වර්ණ රැගෙන යති. වර්ණ පිළියෙල කරනු ලබන්නේ ටැපටා නමින් ඉතා වටිනා සිනිඳු සේල වර්ගයකිනි. එය රන් වාටියකින්ද රන් සහ ලෝහිත පැහැති එල්ලෙන නූල් කැබලි වලින් සරසා ඇත. එකී වර්ණ මතුපිට අදාල රෙජිමේන්තුවේ නිල සළකුණු හා "යුධ බුහුමන්" දැක්වේ. රෙජිමේන්තු එක්සත්භාවය හා එහි සාමූහික ජීවිතය වර්ණ වලින් කියාපායි. යුධ ගිනි වර්ණ වටා රැස්වීමට පැමිණි සෙබළා සිරිතක් කොටගත් අතර, වර්ණ සතුරාට හසුවීම හෝ නැතිවීම විශේෂ සිද්ධියක් වශයෙන් සළකනු ලැබීය. රෙජිමේන්තු ඉතිහාසයේ කීර්තිය හෝ අපකීර්තිය රැඳී ඇති මෙහි ප්‍රධාන වශයෙන් වැදගත්කම රැඳී ඇත්තේ ලයාන්විත හේතුන් මත බව සඳහන් කළ යුතුයි. මේ නිසාම කිසියම් රෙජිමේන්තුවක වර්ණ නැතිවුවහොත් සියලු අරමුණු හා කාර්යයන් උදෙසා එකී රෙජිමේන්තුව අවලංගු කර විසුරුවා හරිනු ලැබූ එකක් සේ සළකනු ලැබේ.

1954 අප්‍රේල් 21 වන දින දෙවන එළිසබෙත් මහරැජිණ 1 වන ලංකා පාබල හමුදාව සිදුකරන ලද කීර්තිමත් රාජකාරී හේතුකොට ගෙන ගාලුමුවදොර පිටියේදී රාජිනී හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කරන ලදී. මෙම වර්ණ ලුතිනන් එස්බී මියනදෙනිය හා 2/ලුතිනන් එෆ්පී වැප්මන් යන නිලධාරී ලබා ගත්හ. වර්ණ ප්‍රදානයත් සමගම 1 වන ලංකා පාබල හමුදාව වෙත අපමණ වශකීමක් හා අසමාන ගෞරවයක් නිතැතින්ම හිමිවිය. පසුව ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමෙන් පසුව 1974 ජනවාරි 29 වන දින රාජිනී සහ රෙජිමේන්තු වර්ණ බලඇණි කෞතුකාගාරයේ තැම්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති වූ අතිගරු ජේ.ආර්. ජයවර්ධන උතුමාණන්ගේ සුරතින් 1978 ඔක්තෝබර් මස 10 වන දින පනාගොඩ ශ්‍රී ලංකා යුධ හමුදා ජනපදයේදී "ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ" නැවත 1 ශ්‍රී ලංකා පාබල හමුදා සරඹ භූමියේදී ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකාව ජනරජයක් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ජනාධිපතිවරයෙකු වෙතින් වර්ණ ධජ හිමි කරගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම නිත්‍ය රෙජිමේන්තුව බවට ඒ අනුව පළවන ශ්‍රී ලංකා පාබල හමුදාව පත්විණ.



ජනාධිපති වර්ණ සහ
රෙජිමේන්තු වර්ණ ලබා ගනිමින්
(1978 ඔක්තෝබර් මස 10 )



II වන එළිසබෙත් රැජිණ විසින් ප්‍රදානය
කරන ලද වර්ණ ධජ
(1974 ජනවාරි 29)



***Published by***
***Regiment Centre Sri Lanka Light Infantry***

## ජනාධිපති වර්ණ ධජය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ධජය සිංහ ධජය වේ. ශ්‍රී ලංකා ජාතික ධජයෙහි තැඹිලි පැහැය ද්‍රවිඩ ජාතීන් වෙනුවෙන්ද, කොළ පැහැය මුස්ලිම් ජාතියද සංකේතවත් කරනු ලබයි. බෝපත් හතර බෞද්ධාගම නියෝජනය කිරීම සඳහා වන අතර, එමගින් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ සංකේතවත් කරනු ලැබේ. වර්තමාන සිංහ ධජයෙහි දැක්වෙන සිංහයාගේ කේසර 24 කි. එයින් දසරාජ ධර්ම (10) ද, දස සක්විති වත් (10) ද, සතර සංග්‍රහ වස්තු (04) ද, අදහස් කෙරේ. වර්ණ ධජයේ තැඹිලි පැහැති සහ කොළ පැහැති වර්ණයන් මධ්‍යයේ රාජ්‍ය ලාංඡනය යොදා ඇත.

